www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# චීන කම්කරුවෝ වෘත්තීය සමිතිවලට එරෙහිව කැරලිගසති

## Chinese workers revolt against the unions

2010 ජූනි 17

චීනයේ හොන්ඩා කර්මාන්ත ශාලාවල ද වෙනත් කර්මාන්ත ශාලාවල ද අඩු පඩි සහ දුෂ්කර වැඩ තත්වයන්ට එරෙහිව එරට කම්කරුවන් මෑත දී ඇති කල වැඩවර්ජන ජාත්‍යන්තරව කම්කරු පන්තිය සඳහා වැදගත් පාඩම් ඉස්මතු කොට ඇත. ආරම්භයේ පටන් මෙම වැඩ වර්ජන හුදෙක් කම්හල් කලමනාකාරිත්වයට සහ ප්‍රාදේශීය අධිකාරීන්ට විරුද්ධව පමනක් නොව බෙයිජිං පාලනයේ කාර්මික පොලිස්කාරයා ලෙස එලිපිටම වැඩ කරන සමස්ත චීන වෘත්තීය සමිති සම්මේලය (ඒසීඑෆ්ටීයූ) ට එරෙහිව ද මෝදු වෙමින් පවත්නා කැරැල්ලක ස්වරූපය ගත්තේ ය.

රාජ්‍යයෙන් ස්වාධීනවූ සංවිධාන හෝ වෘත්තීය සමිති සඳහා කම්කරුවන් විසින් ඉදිරිපත් කරන ලද ඉල්ලීම මෙම අරගලවලින් බොහොමයක දී දක්නට ලැබුනි. පාලකයින් සමග සාකච්ඡා කිරීම සඳහා "මැදිහත්කරුවන්" ලෙස ඒසීඑෆ්ටීයූ වෘත්තීය සමිති නිලධාරීන් ඉදිරිපත් කිරීමට දැරූ ප්‍රයත්නයනක් ප්‍රතික්ෂේප කල ෆොෂාන්හි හොන්ඩා සම්ප්‍රේෂන කර්මාන්තශාලාවේ ද යොන්ග්ෂාන්හි හොන්ඩා ලොක් අගුලු කර්මාන්තශාලාවේ ද කම්කරුවෝ ඒ වෙනුවට තමන්ගේම වැඩවර්ජන නියෝජකයන් තෝරා පත්කර ගත්හ. කම්කරුවෝ ඒසීඑෆ්ටීයූ වෘත්තීය සමිතිය ධනපතියන්ගේ "දඩබල්ලන්" යයි ද කම්කරු පන්තියට "ද්‍රෝහීන්" යයි ද හෙලාදුටුවෝය.

චීනයේ වැඩවර්ජනයන් පුපුරා යා හැකිව තිබුනේ ඒසීඑෆ්ටීයූ තන්ත්‍රයට ද එරෙහිවූ වැඩ වර්ජනයන් ලෙසම පමනි. 1949 දී පිහිටුවන ලද චීන කොමියුනිස්ට් පක්ෂය (සීසීපී)යේ පාලනය සැබෑ සමාජවාදය මත පදනම් වූවක් නොව ස්ටැලින්වාදය මත පදනම් වූවකි. මුල පටන් ම එම පාලනය කම්කරු පන්තියට ගැඹුරෙන්ම විරුද්ධ වූවක් විය. චීන කොපයේ හමුදා නගර අල්ලා ගත් වහාම කම්කරුවන්ගේ සියලු ස්වාධීන අරගල මර්දනය කලහ. නව කොමියුනිස්ට් පක්ෂ ඒසීඑෆ්ටීයූව පිහිටුවාලූයේ වැඩපලවල කම්කරුවන් පාලනය කිරීමේ නිලධර තන්ත්‍රීය උපකරනයක් ලෙසය.

චීන කොපය 1978 දී ධනපති වෙලඳපල වැලඳගැනීමත් සමග කම්කරුවන් කෙරෙහි තම විරුද්ධත්වය උග්‍ර කරගත්තේ ය. 1980 ගන්න වල ආරම්භයේ දී පෝලන්ත කම්කරුවන්ගේ සොලිඩැරිටි ව්‍යාපාරයේ වැඩ වර්ජනවලින් භීතියට පත් චීනයේ බෙයිජිං පාලනය කම්කරු පන්තිය මත තම ග්‍රහනය උග්‍ර කර ගැනීමට පියවර ගත්තේ ය. 1982 දී, එතෙක් චීන කම්කරුවන්ට තිබුනු වැඩ වර්ජනය කිරීමේ නාමික අයිතිය ඉවත්කර දැමූ චීන කොපය ආන්ඩුව රට තුල විරෝධතාවන් මැඩීම සඳහා මහජන සන්නද්ධ පොලීසිය පිහිටුවා ලීය. 1989 දී, ප්‍රජාතන්ත්‍ර අයිතිවාසිකම් ඉල්ලා උද්ඝෝෂනය කල ශිෂ්‍යයන් සමග කම්කරුවන් ද එක්වන්නට පටන්ගත් කල තියනන්මන් චතුරස්‍රයේ පෙලපාලි මැඩීමට චීන කොපය යුද ටැංකි සහ භටයන් යැවීය. ආන්ඩුව රටපුරාම කම්කරුවන් සිරභාරයට ගත්තේ ය.

සිය ගනන් කම්කරුවන් මරා දැමූ මෙම ප්‍රහාරයට වහාම ඒසීඑෆ්ටීයූවේ කර්තව්‍යය වන්නේ කුමක් ද යන්න චීන කොපයේ ප්‍රධාන ලේකම් ජියැං සෙමින් විස්තර කලේ මෙසේ ය. "අපට බලවත් ම කරදරය වන්නේ කම්කරුවන්ගේ ආර්ථික මැසිවිලිය. කම්කරුවන් නැගිට කැරලි ගැසුවොත් එය අපට විශාල ප්‍රශ්නයකි. පෝලන්තයේ සොලිඩැරිටි ව්‍යාපාරයට සමාන චීන සංවිධානයක් ගොඩනොනගන්නට හෝ එවන් දේශපාලන කන්ඩායමක් ක්‍රියාත්මක නොවන්නට වෘත්තීය සමිති සංවිධාන වගබලාගත යුතු ය."

තියනන්මන් ඝාතනය මගින් චීන කොපය ජාත්‍යන්තර ප්‍රාග්ධනයට දැනුම් දුන්නේ තමන් කම්කරු පන්තිය මැඩලීමට අවශ්‍ය ඕනෑම පියවරක් ගැනීමට සූදානම් බවය. ලෝක ධනපතියන් මෙය වටහාගැනීමත් සමග චීනයේ මහා ලාභ ශ්‍රම නිධිවල වාසි භුක්ති විඳීමට ජාත්‍යන්තර ආයෝජන එරට තුලට ගලා ආවේ ය. 1990 ගනන්වල දී මිලියන ගනන් කම්කරුවන් දොට්ට දැමීමට තුඩුදෙමින් රාජ්‍ය අයිතියට යටත් ව්‍යවසායයන් මහාපරිමානව පුද්ගලීකරනයට එරෙහිව පැන නැගි ගනන් නැති වැඩ වර්ජන සහ විරෝධතා සිර කර දැමීමේ ලා ඒසීඑෆ්ටීයූව තීරනාත්මක ක්‍රියාකලාපයක් ඉටු කලේ ය. ගතවූ දශකය තුල දී පුද්ගලික අංශය

ඇතුලට අඬු පඬු විහිදුවාගත් චීන වෘත්තීය සමිති සම්මේලය, චීනයේ දේශීය මෙන්ම විදේශීය කොම්පැනිවල කාර්මික පොලිස් බලය ලෙස ක්‍රියාත්මක විය.

අද ලෝකය පුරාම කම්කරුවන් මුහුන දී සිටින්නේ එක හා සමාන බාධාවන්ටය. ඇමරිකා එක්සත් ජනපදයේ ඒඑෆ්එල්-සීඅයිඕව හෝ ඕස්ට්‍රේලියාවේ ඒසීටියූව [ ශ්‍රී ලංකාවේ සියලු වෘත්තීය සමිති සංවිධාන] වැනි සංවිධාන උපතින් චීනයේ ඒසීඑෆ්ටියූවට වඩා යම් යම් අයුරින් වෙනස්වූයේ වී නමුදු ගතවූ වර්ෂ 30 තුල සෑම රටකම වෘත්තීය සමිති නිලධරයන් කම්කරු පන්තියේ කුමන ස්වාධීන ක්‍රියාකාරිත්වයක් වුව ආන්ඩුව සහ මහ කොම්පැනි සමග අත්වැල් බැඳ මැඩලීම සඳහා ක්‍රියාත්මක වන මර්දනකාරී තන්ත්‍රයන් බවට පරිවර්තනය වී ඇත. වෘත්තීය සමිති සෑමවිටම පැවතී තිබෙන්නේ ලාභ ගරන ධනේශ්වර පද්ධතියේ ආරක්ෂකයන් ලෙසය. පෙර කල ඔවුන් උත්සාහ කලේ සමස්ත සමාජ පර්යායට එරෙහිව කම්කරුවන්ගේ පුලුල් කැරලි ගැසීමක් වැලැක්වීම සඳහා කම්කරුවන්ට සුලු වාසි ලබා දීමට ය. කෙසේ වෙතත් වත්මන්හි ගෝලීකෘත ආර්ථිකයේ පැනනැගීමත් සමග වෘත්තීය සමිති "සාධාරන දිනක වැඩ සඳහා සාධාරන දිනක වැටුප" යන පැරනි ප්‍රතිසංස්කරනවාදී සටන්පාඨය අතහැර දමා ඒ වෙනුවට "ජාත්‍යන්තර තරගකාරිත්වය" පවත්වාගැනීම සඳහා අවසානයක් නැති සහන පාලකයින්ට පිදීමේ සටන්පාඨය වැලඳගෙන ඇත.

වෘත්තීය සමිති පාලකයින්ගේ පැත්ත ගනිමින් කියා සිටින්නේ කම්කරුවන් තමන්ගේ රැකියා හා සේවා කොන්දේසි කැපකොට නිෂ්පාදනය එන්න එන්නම වැඩි කරමින් ලෝකයේ අනෙකුත් රටවල කම්කරුවන් සමග තරගෙට, වැඩිවැඩියෙන් නිෂ්පාදනය කල යුතු බවය.

දෘෂ්ටිමය වශයෙන්, වෘත්තීය සමිති වනාහී එක රටක කම්කරුවන් තවත් රටක ඔවුන්ගේ පන්ති සොහොයුරු සොහොයුරියන්ට එරෙහිව පිහිටුවීම සඳහා යොදාගනු ලබන ජාත්‍යොත්තමවාදයේ සහ ආරක්ෂන වාදයේ තෝතැනි බවට පත්ව ඇත. මෑතක දී චීනයේ කරන ලද වැඩවර්ජනවල දී, ඒඑෆ්එල්-සීඅයිඕ (ඇමරිකානු වෘත්තීය සමිති සම්මේලය), චීන පාලකයන් විසින් කම්කරුවන්ගේ අයිතිවාසිකම් පාගා දැමීම මගින් තමන්ට "අසාධාරන වානිජ වාසියක්" අත්කර ගන්නේ දැයි පරීක්ෂා කර බලන ලෙස ඒසීඑෆ්ටියූව ඔබාමා පාලනාධිකාරයෙන් ඉල්ලා සිටීමට නැඹුරුවිය. වෙනත් වචනවලින් කිවහොත් ඇමරිකානු වෘත්තීය සමිතිවල උත්සුකය වූයේ කිසිසේත්ම ඇමරිකානු සමාගම් ද ඇතුලු මහ සංගත විසින් චීන කම්කරුවන් රුදුරු ලෙස සූරාකෑම අවසන් කිරීම නොවේ. ඒඑෆ්එල් සීඅයිඕ සංවිධානය චීන කම්කරුවන්ගේ "අයිතිවාසිකම්" පිලිබඳව උනන්දු වූයේ එකම එක කරුනක් සඳහා ය; එය වනාහී ඇමරිකානු ප්‍රාග්ධනයේ වඩාත් දුබල කොටස් ආරක්ෂා කර ගැනීමට ද රැකියා වැටුප් හා සේවාකොන්දේසි විනාශ කර දැමීමේ දී තමන් ඉටු කරමින් සිටින්නාවූ භූමිකාව කෙරෙන් අවධානය ඉවතට හැරවීම සඳහා ද චීන කම්කරුවන්ගේ අයිතිවාසිකම් පිලිබඳ ප්‍රශ්නය පාවිච්චි කිරීමට ය.

චීනයේ තම පන්ති සහෝදරයන් සහ සහෝදරියන් මෙන්ම ඇමරිකා එක්සත් ජනපදයේ සහ වෙනත් රටවල කම්කරුවන්ට ද තමන්ගේ ඉතාම මූලික අයිතිවාසිකම් පවා ආරක්ෂා කරගත හැක්කේ චීනයේ රාජ්‍ය පොලිස් උපකරනය ලෙස ක්‍රියා කරන ඒසීඑෆ්ටියූව මෙන්ම තම රට වල වෘත්තීය සමිතිවලට එරෙහිව ක්‍රියාත්මක වන්නා වූ රාජ්‍ය පොලිස් උපකරන වන වෘත්තීය සමිතිවලට එරෙහිව කැරලිගසා නැගිටීමෙන්ම පමනි. අවශ්‍යව පවතින්නේ වෘත්තීය සමිතිවලින් මුලුමනින්ම බිඳී වෙන්වීම පමනක් නොව කම්කරුවන් ඒවාට ගැටගසා තබන්නා වූ විවිධ මධ්‍යම පන්තික යටගිය රැඩිකල් සංවිධානවලින් ද බිඳී වෙන්වීමය. චීනයේ හොන්ඩා කර්මාන්තශාලාවල කම්කරුවන් කලාක් මෙන් මෙහිදී සියලු කම්කරුවන් ගතයුතු වූ ප්‍රථම පියවර වන්නේ තම අරගලයට නායකත්වය දීමට සමත් විශ්වාසවන්ත සාමාන්‍ය කම්කරුවන්ගෙන් සමන්විත කම්කරු ක්‍රියාකාරී කොමිටි තෝරා පත් කර ගැනීමය; ඒ සමග ම තමන් හා සමාන ප්‍රශ්නවලට මුහුනදී සිටින වෙනත් කම්කරුවන් බලමුලුගන්වාගැනීම සඳහා ක්‍රියාත්මක වීමය. සූරාකෑම එහි උල්පතෙන් ම අහෝසි කර දැමීම සඳහා එනම් ලාභ ගරන ධනේශ්වර ක්‍රමය ම අවසන් කර දැමීම සඳහා කම්කරු පන්තියේ බලගතු ස්වාධීන ව්‍යාපාරයක් ගොඩනැගිය හැකි වන්නේ මේ අයුරින්ම පමනි.

එවන් අරගලයක් තීරනාත්මක දේශපාලන ප්‍රශ්න ඉස්මත්තට ගෙන එනු ඇත. චීනය තුල කම්කරුවන්ගේ පැත්තේ ඉන්නවා යැයි මවාපාමින්, "ස්වාධීන වෘත්තීය සමිති" පිලිබඳ ඉල්ලීම අවසාන අරමුනක් ලෙස ඉදිරිපත් කරන්නෝ ද සිටිති. 1989 විරෝධතාවල දී ප්‍රමුඛ ක්‍රියාකලාපයක් ඉටුකල හන් ඩොන්ෆෑං නමැති බෙයිජිං වර්කර්ස් ඔටොනමස් ෆෙඩරේශන් සංවිධානයේ හිටපු නායකයා වෘත්තීය සමිති "අදේශපාලනික කල යුතු යැයි" (වෘත්තීය සමිතිවලින් දේශපාලනය සුද්ධ කල යුතු යැයි) දැන් කියා සිටී. ඔහුට අනුව වෘත්තීය සමිති විසින් කල යුතු එකම දෙය නම් හාම්පුතුන් සමග "සාමූහික කේවෙල් කිරීම් වලට" වැඩ කිරීමය. ඔහුගේ චයිනා ලේබර් බුලටින් නමැති ප්‍රකාශනය පසුගිය මැයි මාසයේ පලකල වාර්තාවකින් කියා සිටින්නේ බෙයිජිනයේ චීන කොප පාලනය විසින් දැන් පැනනගිමින් පවතින්නා වූ කම්කරුවන්ගේ අරගලයන් හිරකර රඳවා තැබීමේ වඩාත්

කාර්යක්ෂම සහ වඩාත් අඩු වියදම් මාධ්‍යයක් ලෙස එවන් වෘත්තීය සමිතිවලට ඉඩ දියයුතු බවය.

මෙයින් පෙන්නුම් කරන්නේ චීන කම්කරුවන් වෙනත් කම්කරුවන්ගේ අත්දැකීම්වලින් පාඩම් උගෙනගැනීම අනිවාර්ය වැදගත්කමක් දරන බවය. 1930 ගනන්වල ඇමරිකානු මෝටර් කම්කරුවන් වැඩපල වාඩිලා කල අරගලයන් තුලින් උපත ලද ඒඑෆ්එල්-සීඅයිඕ සංවිධානය දෙවන ලෝක යුද්ධයෙන් පසු සමාජවාදීන් දඩයම් කරමින් (දැන් හන් ඩොන්ෆෑං කියාසිටින පරිදි) වෘත්තීය සමිති වලින් දේශපාලනය ඉවත් කොට කම්කරුවන් ඩිමොක්‍රටික් පක්ෂයට යටත් කලේ ය. අද මෙම වෘත්තීය සමිති ආන්ඩුව සහ මහ සංගත ධනපතියන් සමග අත්වැල් බැඳ ගෙන වැඩ කරමින් සිටිති. ඇමරිකාවේ එක්සත් මෝටර් කම්කරු සංගමය (යූඒඩබ්ලිව්) සංවිධානය ඔබාමා පාලනාධිකාරය විසින් ජෙනරල් මෝටර්ස් සහ ක්‍රයිස්ලර් යන සමාගම් "ඇප දී බේරා ගැනීම" සමග කෙලින්ම සම්බන්ධ විය. එම සමිතියේ නායකයෝ මහ සංගත වල පාලක කොමිටිවල කොටස්හිමි හවුල්කරුවන් ලෙස ඇඳිගෙන සිටිති. වැටුප් කැපීමේ ද සේවා කොන්දේසි විනාශ කිරීමේ ද ගිවිසුම් වලට කම්කරුවන් යටත් කරන ලද්දේ මොවුන් විසිනි. චීනයේ අසල්වැසි කොරියාවේ වෘත්තීය සමිති සම්මේලය (කේසීටීයූ) දකුනු කොරියාවේ කම්කරු පන්තිය එරට මිලිටරි ඒකාධිපත්‍යයට එරෙහිව 1980 ගනන්වල එලඹි සටන්කාමී අරගල තුලින් පැන නැංගේ ය. පොලිස් රාජ්‍ය මර්දනයට මුහුන දෙමින් එම සංවිධාන වල නායකයෝ දැඩි ධෛර්යයක් සහ අධිෂ්ඨානයක් පෙන්නුම්කලහ. එහෙත් ඔවුන්ගේ දේශපාලන පර්යාලෝකය සීමාවී පැවතුනේ ධනවාදයේ රාමුව තුල වෘත්තීය සමිති අයිතිවාසිකම් දිනාගැනීමට ය. මේ අනුව 1990 ගනන්වල දී කේසීටීයූව නීති ගත කරනු ලැබ එකල්හි පැනනැගි කම්කරුවන්ගේ ජීවිතකාල රැකියා අයිතිය විනාශ කිරීමට එරෙහිව පැනනැගි අරගල යටපත් කර දැමීමේ ලා තීරනාත්මක ක්‍රියාකලාපයක් ඉටු කලේ ය. පසුගිය වර්ෂයේ දී දක්ෂිනාංශික ආන්ඩුවේ ජනාධිපති ලී මයුං-බක් සංයොං මෝටර්රථ කර්මාන්තශාලවේ දිගු කලක් තිස්සේ පැවති කම්කරු වාඩිලා ගැනීම මර්දනය කිරීම සඳහා පොලීසිය යැවූ අවස්ථාවේ දී කේසීටීයූව ඊට සහාය දුන්නේ ය.

මෙහි තීරනාත්මක පාඩම නම් හුදෙක් සටන්කාමී අරගලයම පමනක් සෑහෙන්නේ නැති බවය. ගෝලීය ආර්ථික අර්බුදයේ දෙවන අවධිය දිගහැරෙත්ම සෑම රටකම කම්කරුවන් මුහුන දී සිටින්නේ තමන්ගේ ජීවන තත්වයන් මතට එල්ල වන්නා වූ ගොරතර ප්‍රහාරයන්ට ය - බොහෝ විට මෙම ප්‍රහාරයන් විවිධ රටවල් හරහා එකම ජාත්‍යන්තර මහා සංගත විසින් එල්ල කරනු ලබයි. කම්කරුවන් තමන්ගේ අයිතිවාසිකම් සඳහා සටන පටන් ගත් වහාම ඔවුන් මුහුන දෙන්නේ ආන්ඩුවේ ද මහ සංගත පාලක පැලැන්තියේ ද කාර්මික පොලිසිය ලෙස වැඩට බැසගෙන සිටින වෘත්තීය සමිතිවලට ය.

වෘත්තීය සමිති වනාහී ඓන්ද්‍රියවම ධනවාදයට එරෙහි කුමන අරගලයක් හෝ කිරීමට අසමත් නිලධාරිවාදී උපකරනයන් ය. පැනනැගී ඇත්තේ වෘත්තීය සමිති ප්‍රතිසංස්කරනය කිරීම පිලිබඳ කාරනාවක් නොවේ. සමාජවාදී හා ජාත්‍යන්තරවාදී පර්යාලෝකයක් මත පදනම්ව වෘත්තීය සමිතිවලට එරෙහිව දැනුවත් කැරැල්ලක් සංවිධානය කිරීමය. කම්කරුවන්ට තමන්ගේ රැකියා වැටුප් ජීවන තත්වයන් සහ මූලික අයිතිවාසිකම් ආරක්ෂා කර ගත හැකි එකම මාර්ගය නම් ධනවාදය හංග කර දැමීම සඳහා පොදු අරගලයක් තුල භූගෝල පරිමානව ඒකාබද්ධ වීමය; ධනපති අතලොස්සකගේ ලාභ ආරක්ෂා කිරීම වෙනුවට මානව වර්ගයාගේ අතිමහත් බහුතරයේ අවශ්‍යතාවයන් සපුරාලිය හැකි වන ආකාරයකට සමාජය ප්‍රතිනිර්මානය කිරීමය.

ජෝන් චෑන්

© www.wsws.org